# 2026 ජනවාරි මස 13 දින වත්තේගම නගර සභා රැස්වීම් ශාලාවේ දී පැවති මහා සභා වාර්තාව

➢ **සහභාගී වීම**

| | |
|---|---|
| 1. ඩී.එස්. උයන්ගොඩ මහතා | - ගරු සභාපති |
| 2. ජේ.ඒ.යූ. ගමගේ මහතා, | - ගරු උප සභාපති |
| 3. එච්. ප්‍රියන්ත පුෂ්ප කුමාර මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 4. ඒ.එම්. මොනිකා අබේකෝන් මහත්මිය | - ගරු නගර සභා මන්ත්‍රී |
| 5. ඩී.පී.ඩබ්.ජී අනුර කුමාර මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 6. සී.ඩී. ගුරුගල්ගේ මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 7. බී.ඒ.දුමින්ද පෙරේරා මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 8. ඊ.ජී.ජේ. ආරියවංශ මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 9. ඒ.ජී.ආර්. ගුණවර්ධන මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 10. ආර්.ජී.යූ.සෙතානී රාජමන්ත්‍රී මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 11. ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 12. ඩී.ජී.එස්. විජේසූරිය මහත්මිය | - ගරු නගර සභා මන්ත්‍රී |
| 13. අයි.එම්.එස්.ආර්. රණසිංහ මහත්මිය | - ගරු නගර සභා මන්ත්‍රී |
| 14. ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 15. ඩබ්.ටී. රාජමන්ත්‍රී මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 16. ඩබ්.එම්.ඒ.බී. විරකෝන් මහතා | - ගරු නගර සභා මන්ත්‍රී |
| 17. වී.බී.වස්ගේවත්ත මහතා | - ලේකම් |

➢ සහභාගී නොවීම - නැත

ගරු සභාපති ඩී.එස්. උයන්ගොඩ මහතාගේ ප්‍රධානත්වයෙන් න්‍යාය පත්‍රයට අනුව සභාවේ කටයුතු පෙ.ව 10. 00 ට ආරම්භ විය.

(අ)

**1. 2025.12.11 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව ස්ථිර කර ගැනීම**

1.1 න්‍යාය පත්‍රානුකූලව මුලින්ම ඇත්තේ 2025.12.11 දින පැවති මහා සභා වාර්තාව ස්ථිර කර ගැනීම බව ගරු සභාපතිතුමන් විසින් දන්වන ලදි.

1.2 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද්දේ 2025.12.11 දිනැති මහා සභා වාර්තාවේ පිටු අංක 04 , (ඉ) 01.b සඳහන් **යෝජනාව ස්ථිර කරල ලදි** ලෙස සඳහන් කර ඇත. නමුත් මා විසින් එලෙස යෝජනවක් ස්ථිර නොකළ බවත්, ස්ථිර කිරීම සඳහා යෝජනවාක් නොමැති බවත් සඳහන් කරනවා.

1.3 තවද 2025.12.11 දිනැති මහා සභා වාර්තාවේ පිටු අංක 06 , II.a හි සඳහන් ගරු උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ප්‍රකාශ කර ඇති **මෙම යෝජනාව ස්ථිර කරන ගමන්ම ගරු මහා සභාව**

**කාරක සභාවක් කරන මෙන් යෝජනා කරමි** යන්න එසේ නොවූ ඉවට ගරු නගර සභා මන්ත්‍රි ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

1.4 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රි සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා සංශෝධන වලට යටත්ව වාර්ථාව ස්ථිර කරන ලදි.
1.5 නමුත් 2025.12.11 දිනැති මහා සභාවේ හඬපය්‍ය අනුව 2025.12.11 දිනැති මහා සභා වාර්ථාව නිවැරදි අතර කිසිදු සංශෝධනයක් සිදු කිරීම අවශ්‍ය නොවේ.

1.6 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

1. විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබෙද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් 2025.11.14 දින පැවති මහා සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය**

(ඉ) නගර සභාව අමතා එවන ලද ලිපි, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

(උ) විධිවූ පරිදි කලින් ලියා එවා තිබෙන ප්‍රශ්න - **නැත**

(එ) විධිවූ පරිදි කලින් ලියා එවා තිබෙන යෝජනා

**01. <u>ගරු සභාපති ඩී.එස්. උයන්ගොඩ මහතාගේ යෝජනා</u>**

1. **මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව** සඳහා සාමාජිකයින් පහත පරිදි නම් කිරීමට ගරු මහා සභාවට යෝජනා කරමි.
   i. ගරු සභාපති ඩී.එස්. උයන්ගොඩ මහතා
   ii. ගරු උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මහතා
   iii. ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී. ගුරුගල්ගේ මහතා
   iv. ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.ආර්. ගුණවර්ධන මහතා
   v. ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී.එන්. විජේනායක මහතා
   vi. ගරු නගර සභා මන්ත්‍රී එච්.පී. පුෂ්ප කුමාර මහතා
   vii. ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී. රාජමන්ත්‍රී මහතා

01.1.1 එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ආර්.ජී.යූ.සෙතානී රාජමන්ත්‍රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
01.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.1.3 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රි ආර්.ජී.යූ.සෙතානී රාජමන්ත්‍රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
01.1.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

__විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ කමිටු සාමාජිකයන් පත් කිරීම ඒකමතිකව සභා සම්මත විය**

2. **කර්මාන්ත ජල හා විදුලි කාරක සභාව** සඳහා සාමාජිකයින් පහත පරිදි නම් කිරීමට ගරු මහා සභාවට යෝජනා කරමි.

   i. ගරු උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මහතා
   ii. ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී. යූ.එස්. රාජමන්ත්‍රී මහතා
   iii. ගරු නගර සභා මන්ත්‍රී ඩී.පී.ඩබ්.ජී. අනුර කුමාර මහතා
   iv. ගරු නගර සභා මන්ත්‍රී ඊ.ජී.ජේ. ආරියවංශ මහතා
   v. ගරු නගර සභා මන්ත්‍රී එච්.පී. පුෂ්ප කුමාර මහතා
   vi. ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.ඒ.බී. වීරකෝන් මහතා
   vii. ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මහතා

01.2.1 එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ආර්.ජී.යූ.සෙතානී රාජමන්ත්‍රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

01.2.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>
විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.2.3 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රි ආර්.ජී.යූ.සෙතානී රාජමන්ත්‍රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

01.2.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>
විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් කර්මාන්ත ජල හා විදුලි කාරක සභාවේ කමිටු සාමාජිකයන් පත් කිරීම ඒකමතිකව සභා සම්මත විය**

3. **නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාව** සඳහා සාමාජිකයින් පහත පරිදි නම් කිරීමට ගරු මහා සභාවට යෝජනා කරමි.

   i. ගරු උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මහතා
   ii. ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.ආර්. ගුණවර්ධන මහතා
   iii. ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී. යූ.එස්. රාජමන්ත්‍රී මහතා
   iv. ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ. දුමින්ද පෙරේරා මහතා
   v. ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ටී. රාජමන්ත්‍රී මහතා
   vi. ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්. මොනිකා අබේකෝන් මහත්මිය
   vii. ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මහත්මිය

01.3.1 එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී.යූ.සෙතානී රාජමන්ත්‍රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

01.3.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>
විවෘද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.3.3 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී.යූ.සෙතානී රාජමන්ත්‍රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

01.3.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාවේ කමිටු සාමාජිකයන් පත් කිරීම ඒකමතිකව සභා සම්මත විය**

4. **පරිසර හා සෞඛ්‍ය කාරක සභාව** සඳහා සාමාජිකයින් පහත පරිදි නම් කිරීමට ගරු මහා සභාවට යෝජනා කරමි.

i. ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ. දුමින්ද පෙරේරා මහතා
ii. ගරු නගර සභා මන්ත්‍රී ඊ.ජී.ජේ. ආරියවංශ මහතා
iii. ගරු නගර සභා මන්ත්‍රී ඩී.පී.ඩබ්.ජී. අනුර කුමාර මහතා
iv. ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී. ගුරුගල්ගේ මහතා
v. ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී.එන්.විජේනායක මහතා
vi. ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.ඒ.බී. වීරකෝන් මහතා
vii. ගරු නගර සභා මන්ත්‍රී අයි.එම්.එස්.ආර්. රණසිංහ මහත්මිය

01.04.1 එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී.යූ.සෙතානී රාජමන්ත්‍රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

01.04.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>
විවෘද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.04.3 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී.යූ.සෙතානී රාජමන්ත්‍රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

01.04.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>
විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් පරිසර හා සෞඛ්‍ය කාරක සභාවේ කමිටු සාමාජිකයන් පත් කිරීම ඒකමතිකව සභා සම්මත විය**

5. 2025 වර්ෂයට අදාල පාලන වාර්ථාව ගරු මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරමි.

6. වත්තේගම නගර සභාවේ දෛනික කටයුතු වෙනුවෙන් භාවිත වන වාහන සඳහා ඉන්ධන වත්තේගම රණතුංග සහ පුත්‍රයා සමාගම වෙතින් දින 15 න් 15 ට බිල්පත් පියවීමේ පදනම මත ලබා ගන්නා අතර ඒ සඳහා රු. 400,000.00 ක ඇප තැන්පතුවක් වාර්ෂිකව තැන්පත් කරනු ලබයි. 2026 වර්ෂය සඳහා එම ඇප තැන්පතුව අලුත් කිරීම සඳහා වන ඉල්ලීම.

01.6.1 එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය විසින් ස්ථිර කරන ලදි

01.6.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.6.3 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය විසින් ස්ථිර කරන ලදි.

01.6.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් වත්තේගම රණතුංග සහ පුත්‍රයා සමාගම වෙත රු.400,000.00 ක ඇප තැම්පතුවක් තැබීම ඒකමතිකව සභා සම්මත විය**

7. වත්තේගම නගර සභාව විසින් එක්රැස් කරනු ලබන පෙට් බෝතල් දැනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව වෙත කිලෝ එකක් රු. 20ක මුදලකට අලෙවි කරන අතර මෙම පෙට් බෝතල් මිලදී ගැනීම සඳහා අකුරණ අංක 76/F, උඩවැලිකැටිය ස්ථානයේ එම්.එම්.එම්. නියාස් මහතා විසින් පෙට් බෝතල් කිලෝ 01ක් රු.35කට හා ප්ලාස්ටික් කිලෝ 01 ක් රු.35කට මිලදී ගැනීමට කර ඇති ඉල්ලීම අනුව අදාල පෙට් බොතල් හා ප්ලාස්ටික් අලෙවිය සම්බන්ධ තීරණ ගැනීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදි. ඒ අනුව කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව විසින් ගෙවනු ලබන මුදලට වඩා වැඩි මුදලක් ඉල්ලුම්කරු විසින් ගෙවන බැවින් කිලෝ එකකට රු. 15.00 ක ලාභයක් ඇති බැවින් හා පෙට් බෝතල් ඔහු විසින් පැමිණ රැගෙන යාම නිසා අප විසින් කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව වෙත ගෙන ගොස් භාරදීමේදී දැරීමට සිදු වූ ප්‍රවාහන වියදම ඉතිරි වන බැවින් එම්.එම්.එම්. නියාස් මහතා වෙත පෙට් බෝතල් හා ප්ලාස්ටික් අලෙවි කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්ති බවට කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි.ඒ අනුව ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

01.7.1 එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය විසින් ස්ථිර කරන ලදි.

01.7.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

1.විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.7.3 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය විසින් ස්ථිර කරන ලදි.

01.7.4 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

1. විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් වත්තේගම නගර සභාව විසින් එක්රැස් කරනු ලබන පෙට් බෝතල් අකුරණ අංක /76F, උඩවැලිකැටිය ස්ථානයේ එම්නියාස් මහතා .එම්.එම්. වෙත අලෙවි කිරීම සම්බන්ධව ඒකමතිකව සභා සම්මත විය**

**8.** 2026 වර්ෂයේ මාසික කමිටු පැවැත්වීමට නියම කරගන්නා ලද දිනයන් ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

## වත්තේගම නගර සභාවේ 2026 වර්ෂයේ කමිටු කාලසටහන

| මාසය | මහා සභාව | | නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාව | | පරිසර හා සෞඛ්‍ය කාරක සභාව | | කර්මාන්ත, ජල හා විදුලි කාරක සභාව | | මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දිනය | වේලාව | දිනය | වේලාව | දිනය | වේලාව | දිනය | වේලාව | දිනය | වේලාව |
| ජනවාරි | 13 | පෙ.ව 10.00 | 20 | පෙ.ව 10.00 | 20 | ප.ව 2.00 | 21 | ප.ව 2.00 | 28 | පෙ.ව 10.00 |
| පෙබරවාරි | 12 | පෙ.ව 10.00 | 17 | පෙ.ව 10.00 | 17 | ප.ව 2.00 | 18 | ප.ව 2.00 | 24 | පෙ.ව 10.00 |
| මාර්තු | 12 | පෙ.ව 10.00 | 17 | පෙ.ව 10.00 | 17 | ප.ව 2.00 | 18 | ප.ව 2.00 | 26 | පෙ.ව 10.00 |
| අප්‍රේල් | 9 | පෙ.ව 10.00 | 21 | පෙ.ව 10.00 | 21 | ප.ව 2.00 | 22 | ප.ව 2.00 | 28 | පෙ.ව 10.00 |
| මැයි | 14 | පෙ.ව 10.00 | 19 | පෙ.ව 10.00 | 19 | ප.ව 2.00 | 20 | ප.ව 2.00 | 26 | පෙ.ව 10.00 |
| ජූනි | 11 | පෙ.ව 10.00 | 23 | පෙ.ව 10.00 | 23 | ප.ව 2.00 | 24 | ප.ව 2.00 | 30 | පෙ.ව 10.00 |
| ජූලි | 14 | පෙ.ව 10.00 | 21 | පෙ.ව 10.00 | 21 | ප.ව 2.00 | 22 | ප.ව 2.00 | 28 | පෙ.ව 10.00 |
| අගෝස්තු | 13 | පෙ.ව 10.00 | 18 | පෙ.ව 10.00 | 18 | ප.ව 2.00 | 19 | ප.ව 2.00 | 25 | පෙ.ව 10.00 |
| සැප්තැම්බර් | 15 | පෙ.ව 10.00 | 22 | පෙ.ව 10.00 | 22 | ප.ව 2.00 | 23 | ප.ව 2.00 | 29 | පෙ.ව 10.00 |
| ඔක්තෝබර් | 13 | පෙ.ව 10.00 | 20 | පෙ.ව 10.00 | 20 | ප.ව 2.00 | 21 | ප.ව 2.00 | 27 | පෙ.ව 10.00 |
| නොවැම්බර් | 12 | පෙ.ව 10.00 | 17 | පෙ.ව 10.00 | 17 | ප.ව 2.00 | 18 | ප.ව 2.00 | 25 | පෙ.ව 10.00 |
| දෙසැම්බර් | 10 | පෙ.ව 10.00 | - | - | - | - | - | - | 29 | පෙ.ව 10.00 |

01.8.1 එම යෝජනාව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

01.8.2 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා

1.විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

**01.8.3 ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි මෙම දින වෙන් කිරීමේදී 2025 වර්ෂයේදීත් යම් යම් ගැටළු ඇති උනා. ඒ අනුව මම හිතනවා මේක ලේකම්තුමා ඇතුළු කාර්යමණ්ඩලය එකතුවෙලා නිවැරදි ලෙස කරන ලද දින වෙන් කිරීමක් කියලා. ඒ වගේම මේ වෙන් කරලා තියෙන දින ප්‍රමානවත් නැත්තම් නැවත සංශෝධනයක් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

01.8.4 ඒ අනුව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

01.8.5 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා

1. විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් වත්තේගම නගර සභාවේ 2026 වර්ෂයේ කමිටු කාල සටහන ඒකමතිකව සහා සම්මත විය**

09. වත්තේගම පැරණි නගර සභා ගොඩනැගිලලේ බිම් මහල (අංක 49 කඩ කාමරය)2026 වර්ෂය සඳහා බදු දීමේදී අදාල බදුකරු විසින්, බදු ලබා දෙන කාලසීමාව අවුරුදු 05ක කාලයකට දීර්ස කර ගැනීම හා වෙළඳ ආරක්ෂණ තැන්පතුව සදහා අය කරන ගාස්තුව මාස 03ක කඩ කුලී මුදලට සමාන මුදලක් දක්වා අඩු කර ගැනීම සඳහා කර ඇති ඉල්ලීම් සම්බන්ධව සාකච්ඡා කර උපදෙස් ලබා ගැනීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත ඉදිරිපත් කළ බව දන්වමි.

ඒ අනුව මුදල් කමිටුවේ නිර්දේශය වනුයේ

I. වත්තේගම පැරණි නගර සභා ගොඩනැගිල්ල අංක 49 කඩ කාමරය වසර 03ක කාලයක් සදහා එකවර බදු දීමක් සිදුකරන්නේ නම් දැනට එකඟ වී ඇති කඩකුලිය වාර්ෂිකව 5% බැඟින් වැඩි කිරීම.

II. එසේ නොමැති නම් වසරක කාලයක් සඳහා බදු දීමක් සිදුවන්නේනම් දැනටමත් ඔහු විසින් ගෙවා ඇති මාස හයක (06) කඩකුලි මුදලට සමාන වෙළඳ ආරක්ෂන තැන්පතු මුදල ඉල්ලුම් කර ඇති පරිදි මාස තුනක (03) ක කඩ කුලියට සමාන මුදලක් ලෙස අය කර, ගෙවා ඇති ඉතිරි මුදල මාස 03ක කඩ කුලීයට හිලව් කිරීම.

2025.12.30 දින පැවති මුදල් කමිටුවේ නිර්දේශය මත ඉහත ඡේද අංක 2.I හා 2.II පිළිබඳව බදුකරු වෙත දුරකථන මගින් දැනුම්දීමෙන් අනතුරුව ඉහත 2.I වැනි කාරණය වන කඩ කාමරය අවුරුදු 03ක කාලයක් සඳහා එකවර බදු ගැනීමටත්, ඒ අනුව කඩකුලිය වාර්ෂිකව 5% බැගින් වැඩිකිරීමේ කොන්දේසියට එකඟතාවය පල කරන බවත් එදිනම (2025.12.30 වන දින ) දුරකථන මගින් දැනුම්දෙන ලදී. මෙම කාරණය 2026.01.08 දින නැවත වතාවක් ඔහු විසින් තහවුරු කරන ලදී. මේ සම්බන්ධයෙන් ඔහු වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු කරන බවද දන්වමි.

ඒ අනුව ඉහත ඡේද අංක 2.I තීරණය ගරු මහා සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන ලදි.

01.9.1 එම යෝජනාව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

01.9.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

1.විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.9.3 ඒ අනුව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

01.9.4 **<u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>**

1. විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් වත්තේගම පැරණි නගර සභා ගොඩනැගිල්ල අංක එකවර බ ක කාලයක් සදහා03 කඩ කාමරය වසර 49දු දීමක් සිදුකිරීමටත්, කඩකුලිය වාර්ෂිකව %5බැඟින් වැඩි කිරීමටත් ඒකමතිකව සභා සම්මත විය**

- **ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.කේ. රොෂාන් ජයවීර මැතිතුමා පෞද්ගලික අවශ්‍යතාවයක් හේතුවෙන් සියළුදෙනාගේ කැමැත්ත ඇතුව ගරු මහා සභාවෙන් පෙ.ව 10.20ට පිටව යන ලදි.**

10 කෙටි කාලීන පදනම මත බදු ලබා දී තිබූ වත්තේගම නුවර පාර පැරණි නගර සභා ගොඩනැගිල්ලේ බිම්මහළ සහ ඉහළ මහලේ කඩ කාමර දෙක සඳහා 2025 වර්ෂයේ හිඟ කඩ කුලී මුදල් හා පොදු වෙළඳපොළ අංක 14 දරණ කඩ කාමරයේ හිඟ විදුලි ගාස්තු මුදල් තවදුරටත් අයවීමට ඇත. එම කඩ කාමර 2025 වර්ෂය සඳහා බදු දීමේදී, අදාල බදුකරුවන් විසින් තබන ලද වෙළඳ ආරක්ෂන තැන්පතු, ටෙන්ඩර් තැන්පතු හා විදුලි තැන්පතු මුදලින් අදාල හිඟ මුදල් හිලව් කරන ලෙස එම බදුකරුවන් විසින් ඉල්ලුම් කර ඇති අතර එසේ තැන්පතුවලින් හිඟ මුදල් හිලව් කිරිමට හැකියාවක්ද පවති. මේ සම්බන්ධව සාකච්ඡා කර උපදෙස් ලබා ගැනීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත ඉදිරිපත් කළ අතර මෙම හිඟ කඩ කුලි මුදල් හා හිඟ විදුලි ගාස්තු අදාල පරිදි එම තැන්පතු මුදල් වලින් අයකර ගැනීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි. මෙලෙස හිග මුදල් තැන්පතු වලින් අය කර ගන්නා තෙක් නොසිට හිග මුදල් ගෙවන ලෙසට බලපෑම් කර හිග අයකර ගැනීමට කටයුතු කල යුතු කිරීම සුදුසු බවට කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි. ඒ අනුව ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

01.10.1 එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී අයි.එම්.එස්.ආර්. රණසිංහ මැතිනිය විසින් ස්ථිර කරන ලදි.

01.10.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

1.විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.10.3 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී අයි.එම්.එස්.ආර්. රණසිංහ මැතිනිය විසින් ස්ථිර කරන ලදි.

01.10.4 **<u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>**

1. විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් වත්තේගම නුවර පාර පැරණි නගර සභා ගොඩනැගිල්ලේ බිම්මහළ සහ ඉහළ මහලේ කඩ කාමර දෙක සඳහා 2025 වර්ෂයේ හිඟ කඩ කුලි මුදල් හා පොදු වෙළඳපොළ අංක 14 දරණ කඩ කාමරයේ හිඟ විදුලි ගාස්තු මුදල් වෙළඳ ආරක්ෂන තැන්පතු, ටෙන්ඩර් තැන්පතු හා විදුලි තැන්පතු මුදලින් හිලව් කිරීමට ඒකමතිකව සභා සම්මත විය**

11. පොදු වෙළඳපොල අංක 48 දරණ කඩ කාමරය 2022.01.01 දින සිට 2025.12.31 දින දක්වා කාලයට කෙටි කාලින පදනම මත ආර්.ජී.සුනිල් ජෙයරාජ් මයා විසින් බදු ගෙන ඇති අතර ඉන්පසු 2026.01.01 දින සිට 2028.12.31 දින දක්වා ඔහු විසින්ම නැවතත් බදු ගැන ඇත. ඒ සඳහා ඔහු වෙත පහත සඳහන් පරිදි අදාල මුදල් ගෙවන ලෙස දන්වා තිබුණි.

- 2026.01.01-2026.12.31 දක්වා කඩ කුලිය - 44000.00
- මාස 06ක වෙළඳ ආරක්ෂණ තැන්පතු - 22000.00
- විදුලිය සඳහා ඇප තැන්පතු - 3000.00

ඒ අනුව මුළු එකතුව - 69,000.00 ක් වන අතර 2022 වර්ෂය සඳහා ආර්.ජී.සුනිල් ජයරාජ් මයා විසින් තබන ලද වෙළඳ ආරක්ෂන තැන්පතු, ටෙන්ඩර් තැන්පතු හා විදුලි තැන්පතු මුදලින් හා 2025 වර්ෂයේ තබන ලද ටෙන්ඩර් තැන්පතු මුදලින් වෙළඳ ආරක්ෂණ තැන්පතුව හා විදුලි තැන්පතුව පහත පරිදි හිලව් කිරීමට හැකියාවක් පවතියි.ඒ සඳහා මුදල් ගෙවූ ලදුපතේ මුල්පිටපත අවශ්‍ය ව ඇති නමුත් එම ලදුපත් අස්ථාන ගතවී ඇති බව ඔහු විසින් දන්වා ඇත. තවද 2026.01.01 සිට 2026.12.31 දක්වා කඩකුලී මුදල එකවර ගෙවිය යුතු අතර එම මුදල මාසිකව ගෙවීමට අවස්ථාව සළසා දෙන ලෙස ද ඉල්ලීමක් කර ඇත.

ඒ අනුව වත්තේගම නගර සභාව සතු රිසිට් පත් වල පිටපත් ලබා දීමේ හැකියාවක් ඇති බැවින් මුල් පිටපත් ලැබීමෙන් පසු නැවත මුදල් ලබා නොගන්නා බවට දිවුරුම් ප්‍රකාශයක් ලබා දීමෙන් තහවුරු කළ යුතු බවත් මාසිකව කඩකුලී ගෙවීමට හැකියාව ඇති බවත් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදී නිර්දේශ වූ අතර ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

01.11.1 එම යෝජනාව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**01.11.2** ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා

1.විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

**01.11.3 ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි අපි මෙම අවුරුදු 03 සඳහාම එකම මුදලද අය කරන්නේ? පෙර පැවසූ පරිදි වාර්ෂිකව බදු ප්‍රමාණය වැඩි කිරීමේ හැකියාවක් තිබෙනවාද? මෙලෙස වසර 03 සඳහාම එකම අගයකට ලබා දීම ගැටළුවක් නොවේද?

01.11.3.1 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා විසින් කාරක සභාවක් කළ අතර ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.11.3.2කාරක සභා අවස්ථාවේ ආදායම් පරීක්ෂක මල්ලිකා සෙනරත්මැණිකේ මිය විසින් ගරු මහා සභාව හමුවේ කරුණු පහදා දෙන ලදි.

01.11.3.3පසුව කාරක සභාව, නැවත මහා සභාවක් කිරීමට ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්. මොනිකා අබේකෝන් මැතිනිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

01.11.3.4ඒ අනුව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

01.11.3.5 **ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා**

1. විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් ඒ අනුව වත්තේගම නගර සභාව සතු රිසිට් පත් වල පිටපත් ලබා දීමේ හැකියාවක් ඇති බැවින් මුල් පිටපත් ලැබීමෙන් පසු නැවත මුදල් ලබා නොගන්නා බවට දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමෙන් පසු එම මුදල් හිලව් කිරීමට ඒකමතිකව සභා සම්මත විය**

**12.** <u>පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් CPC/ACLG/K/AM/10/1/5 අංක දරන 2025.12.15 දිනැති මහා සභා වාර්තා සඳහා නිරීක්ෂණ ලබා දීම - 2025.08.12 මහා සභාව යන මැයෙන් එවන ලද ලිපියෙහි සඳහන් නිරීක්ෂණ අනුව නැවත සංශෝධන ලෙස ඉදිරිපත් කළ යුතු යෝජනා ගරු මහා සභාවේ අනුමැතිය සඳහා යෝජන කරමි.</u>

**a)** 2025.08.12 දිනැති මාහා සභා වාර්තාව අනුව (ඉ) 01. හි සඳහන් පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ,කුණ්ඩසාලේ මඟින් 2025.07.25 දින එවන ලද "1989 අංක 12 දරණ පළාත්සභා ( අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තිය යටතේ කරනු ලබන නියමය පිළිබඳව " ලිපිය.

01.12.a.1 එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්. මොනිකා අබේකෝන් මැතිනිය විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

<u>01.12.a.2 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.12.a.3ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්. මොනිකා අබේකෝන් මැතිනිය විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>01.12.a.4 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>**

විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් වත්තේගම 2025.08.12 දිනැති මාහා සභා වාර්තාව අනුව (ඉ) 01. හි සඳහන් පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ,කුණ්ඩසාලේ මඟින් 2025.07.25 දින එවන ලද "1989 අංක 12 දරණ පළාත්සභා ( අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තිය යටතේ කරනු ලබන නියමය පිළිබඳව ඒකමතිකව සභා සම්මත විය**

b) 2025.08.12 දිනැති මාහා සභා වාර්තාව අනුව (ඉ) 05. හි සඳහන් සභාව සතු භාවිතයට නොගන්නා වාහන හා යන්ත්‍ර උපකරණ සම්බන්ධවයි. ඒ අනුව පහත අංක දරණ වාහන හා යන්ත්‍ර උපකරණ සඳහා වාර්ෂිකව විශාල පිරිවැයක් දරමින් නඩත්තු කළද සභාවේ දෛනික කටයුතු සඳහා ඵලදායීව භාවිතයට නොගනී. ඒ අනුව මෙම වාහන වෙන්දේසි කිරීමට මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් පත්කරනු ලබන කමිටුවක් වෙත යොමු කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

- CPGF – 3103 ටේලරය
- CPGF – 2973 ටේලරය
- CPKI – 0016 ජීප් රථය
- CPGF – 0696 අත් ට්‍රැක්ටරය
- 37 – 9805 ට්‍රැක්ටරය
- CPHN – 2767 බැකෝ යන්ත්‍රය
- KIRLOSKAR DM 10 KW ජෙනරේටරය

01.12.b.1 එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එච්. ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

01.12.b.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.12.b.3 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී එච්. ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>01.12.b.4 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>**

විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් 2025.08.12 දිනැති මාහා සභා වාර්තාව අනුව (ඉ) 05. හි සඳහන් සභාව සතු භාවිතයට නොගන්නා වාහන හා යන්ත්‍ර උපකරණ වෙන්දේසි කිරීමට මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් පත්කරනු ලබන කමිටුවක් වෙත යොමු කිරීමට ඒකමතිකව සභා සම්මත විය**

c) 2025.08.12 දිනැති මාහා සභා වාර්තාව අනුව (ඉ) 07. හි සඳහන් වත්තේගම නගර වාසීන්ට තියෙන පිරිසිදු පානීය ජල හිඟයට විසඳුමක් ලෙස පුංචිමෝල ජල ව්‍යාපෘතිය අපි ආරම්භ කරා. ඒ සඳහා පළාත් සභාව මඟින් රු.මි 6ක ප්‍රතිපාදන වෙන් වී තිබෙනවා. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මහනුවර මහා නගර සභාවේ පැවති සාකච්ඡාව අනුව දළ ඇස්තමේන්තුව මේ සඳහා ඉදිරිපත් කරලා තියෙනවා. එමෙන්ම ජල පෙරහනය මෙම පුංචිමෝල ඉඩමේ බැවුමත් එක්ක ඉදිකිරීම අපහසු බැවින් අපි තීරණය කරා උඩුරාවණ ජල ටැංකිය තිබෙන තැනම පෙරනයක් හදන්න. ඒ අනුව මහනුවර නගර සභාවේ අප ජල කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු දිනුක සෙනෙවිරත්න මහතා හා ඉංජිනේරු තුෂාර ජයතිස්ස මහතා හමුවී මේ පිළිබඳව වාර්තාව.

01.12.c.1 එම යෝජනාව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

<u>01.12.c.2 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

1.විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.12.c.3 ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් පළාත් පාලන කොමසාරිස් විසින් මහා සභා වාර්තා පිළිබඳව එවන ලද නිරීක්ෂණ, සභාව හමුවේ පැහැදිලි කරන ලදි.

01.12.c.4 ඒ අනුව පසුව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>01.12.c.5 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>**

1. විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් 2025.08.12 දිනැති මාහා සභා වාර්තාව අනුව (ඉ) 07. හි සඳහන් වත්තේගම නගර වාසීන්ට තියෙන පිරිසිදු පානීය ජල හිඟයට විසඳුමක් ලෙස පුංචිමෝල ජල ව්‍යාපෘතිය ආරම්භ කිරීම පිළිබඳ වාර්ථාව ඒකමතිකව සභා සම්මත විය**

d) 2025.08.12 දිනැති මාහා සභා වාර්තාව අනුව (එ) 01.III. හි සඳහන් Clean Sri Lanka වැඩ සටහන මඟින් 2025.07.09 දින පැවති මාර්ගගත සාකච්ඡාව අනුව " පළාත් පාලන ආයතන මට්ටමින් ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති වල ප්‍රගතිය සම්බන්යෙන් සාකච්ඡා කිරීම " යටතේ අප වත්තේගම නගර සභාව විසින් ඇමුණුම 05 යටතේ සංවර්ධන යෝජනා 7ක් ඉදිරිපත් වී ඇත.

පෙර වාර්ථාවේ ඇමුණුම යටතේ දක්වා ඇති 05Clean Sri Lanka වැඩ සටහන යටතේ පළාත් පාලන ආයතන මට්ටමින් ක්‍රියාත්මක කිරමට නියමිත වූ වත්තේගම නගර සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමණාකරනය සඳහා කම්පැක්ටර් රථයක් ලබා ගැනිම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිලිබඳ ලිපිය නැවත සභා ගත කරමි.

01.12.d.1 එම යෝජනාව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

01.12.d.2 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා

1.විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.12.d.3 ඒ අනුව පසුව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

**01.12.d.4 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා**

1. විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් 2025.08.12 දිනැති මාහා සභා වාර්තාව අනුව 2025.08.12 දිනැති මාහා සභා වාර්තාව අනුව (එ) 01.III. හි සඳහන් Clean Sri Lanka වැඩ සටහන මඟින් 2025.07.09 දින පැවති මාර්ගගත සාකච්ඡාව අනුව වත්තේගම නගර සභාව විසින් ඇමුණුම 05 යටතේ ඉදිරිපත් කර තිබූ සංවර්ධන යෝජනා 7 ඒකමතිකව සභා සම්මත විය**

13. පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් එවන ලද CPC/ACLG/K/AM/10/1/5 අංක දරන 2025.12.15 දිනැති මහා සභා වාර්ථා සඳහා නිරීක්ෂණ ලබා දීම - 2025.09.09 මහා සභාව යන මැයෙන් එවන ලද ලිපියෙහි සඳහන් නිරීක්ෂණ අනුව නැවත සංශෝධන ලෙස ඉදිරිපත් කළ යුතු යෝජනා ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**a)** 2025.09.09 දිනැති මාහා සභා වාර්තාව අනුව (ඉ) 02. හි සඳහන් සූර්ය පැනල් පද්ධතිය පිළිබඳ ව්‍යාපෘතිය අවලංගු කිරීම සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.

01.13.a.1 එම යෝජනාව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

01.13.a.2 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා

1.විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

01.13.a.3 ඒ අනුව පසුව ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

**01.13.a.4 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා**

1. විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් 2025.09.09 දිනැති මාහා සභා වාර්තාව අනුව (ඉ) 02. හි සඳහන් සූර්ය පැනල් පද්ධතිය පිළිබඳ ව්‍යාපෘතිය අවලංගු කිරීම සඳහා ඒකමතිකව සභා සම්මත විය**

**02.** **ගරු උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මහතා**

i වත්තේගම රෝහල ආශ්‍රිත පරිශ්‍රයේ නාය යෑමකට ලක් වී ඇති බැවින් තවදුරටත් එය ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයකට පත්වී ඇත. මේ සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආධාර මුදල් මත නව රෝහලක් වත්තේගම නගරය තුල ඉදිකිරීමට කටයුතු යොදන මෙන් යෝජනා කරමි.

ii. **නුවරතැන්න මාර්ගය නායයෑමකට ලක්ව ඇති** ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සිදුකළ යුතු බැවින් එම මාර්ගයේ කාණු පද්ධතිය සකස් කළ යුතු බවට යෝජනා කරමි.

02.1 එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ දුමින්ද පෙරේරා මැතිතුමා විසින් යෝජනාව ස්ථිර කරන ලදි

02.2 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා

1.විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

02.3 ඒ අනුව ගරු නගර සභා මන්ත්‍රී බී.ඒ දුමින්ද පෙරේරා මැතිතුමා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

02.4 **ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා**

1. විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් වත්තේගම රෝහල ආශ්‍රිත පරිශ්‍රයේ නාය යෑම හේතුවෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආධාර මුදල් මත නව රෝහලක් වත්තේගම නගරය තුල ඉදිකිරීම හා නුවරතැන්න මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීම පිළිබඳව යෝජනවා ඒකමතිකව සභා සම්මත විය**

**03.** **ගරු නගර සභා මන්ත්‍රී ආර්.ජී.යූ.ආර්.එස් රාජමන්ත්‍රී මහතාගේ යෝජනා**

බලහෙල පිටියේගෙදර වැලිකල මහතාගේ, නිවස අසලින් යන මාර්ගය නායයාම හේතුවෙන් මාර්ගය ප්‍රති සංස්කරනය කර දෙන ලෙස යෝජනා කරමි.

03.1 එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

03.2 ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා

1.විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

03.3 ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

03.4 **ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා**

1. විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් බලහෙල පිටියේගෙදර වැලිකල මහතාගේ, නිවස අසලින් යන මාර්ගය ප්‍රති සංස්කරනය කිරීම පිළිබඳව යෝජනවා ඒකමතිකව සභා සම්මත විය**

**04.** **ගරු නගර සභා මන්ත්‍රී ඊ.ජී.ජේ ආරියවංශ මහතාගේ යෝජනා**

i. ඇලඋඩවත්ත මාර්ගයේ ඉහළ කොටසේ උපතිස්ස මහතාගේ නිවස අසල සිට ඉදිරියට ඇති කොටස සංවර්ධනය කර දෙන මෙන් යෝජනා කරමි.

ii. මුදුනේ ගම්මැද්ද හරහා සුසාන භූමිය දක්වා බැකෝ යන්ත්‍රයක් යොදා පාර සකසා දෙන ලෙස යෝජනා කරමි.

iii. ඇලඋඩවත්ත සේවා පියසට එන මාර්ගයට පස් පුරවා සකස් කර දෙන මෙන් යෝජනා කරමි.

04.1 එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

04.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

1.විවාද අවස්ථාවයි, මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්

04.3 ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

04.4 **<u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>**

1. විරුද්ධ වීමක් හෝ බෙදීමක් තිබේද?

**විරුද්ධ වීමක් හෝ බෙදීමක් සිදු නොවූ බැවින් ඇලඋඩවත්ත මාර්ගයේ ඉහළ කොටසේ උපතිස්ස මහතාගේ නිවස අසල සිට ඉදිරියට ඇති කොටස සංවර්ධන කිරීම, මුදුනේ ගම්මැද්ද හරහා සුසාන භූමිය දක්වා බැකෝ යන්ත්‍රයක් යොදා පාර සකසීම හා ඇලඋඩවත්ත සේවා පියසට එන මාර්ගයට පස් පුරවා සකස් කිරීම යන යෝජනා ඒකමතිකව සභා සම්මත විය**

(ඔ) සෙසු කරුණු

01. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

1. පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය , පල්ලේකැලේ, කුණ්ඩසාලේ මඟින් අගෝස්තු හ සැප්තැම්බර් මාසයන්හි මහා සභා වාර්තා පිළිබද එවන ලද නිරීක්ෂණ ලිපි

2. ආරක්ෂක ඇඳුම් හා නිළ ඇඳුම් 2026 වර්ෂය සඳහා නිකුත් කිරීම සම්බන්ධයෙන් කර ඇති ඉල්ලීම

**01.2.1 ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්. මොනිකා අබේකෝන් මැතිනිය**

ගරු සභාපතිතුමනි මම දැනගන්න කැමති මෙම නිළ ඇඳුම් ලබා දෙන්නේ නිත්‍ය තනතුර සඳහා පමනක්ද? මොකද ආයුරුවේද සංයෝජක සදහා නිළ ඇඳුමක් තියෙනවා, නමුත් එම සේවයේ නියෙලෙන්නා එම තනතුරේ නෙවෙයි. ඒ අනුව ඒ කාර්ය කරන කෙනාටත් නිළ ඇඳුමක් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වගේම එම නිළ ඇදුම භාවිතා කරන්න උපදෙස් දෙන්න කියලත් මම ඉල්ලා සිටිනවා.

01.2.2 මේ පිළිබඳව වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා මෙම මහා සභාව ගරු නගර සභා මන්ත්‍රී එච්. ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් කාරක සභාවක් කිරීමට යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩී.ජී.එස්. විජේසූරිය මැතිනිය විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

01.2.3 ඒ අනුව නගර සභා ලේකම් වී.බී වස්ගේවත්ත මහතා විසින් කරුණු පැහැදිලි කරන ලදි.

01.2.4 පසුව කාරක සභාව ගරු නගර සභා මන්ත්‍රී එච්. ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්. මොනිකා අබේකෝන් මැතිතුමිය විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

පපප/ශුපසහ/03/07

2026.01 06.

ගරු සභාපතිතුමා,

නගර සභාව,

වත්තේගම

<u>ආරක්ෂක ඇඳුම් හා නිල ඇඳුම් 2026 වර්ෂය සඳහා නිකුත් කිරීම සම්බන්ධයෙන් කර ඇති ඉල්ලීම පිළිබඳ තොරතුරු වාර්තා කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXI පරිච්ඡේදයේ නිකුත් කිරීම සඳහා බලපාන ප්‍රතිපත්ති හා 2013.04.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2013 හා 1991.08 .07 වන දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 27/91 ප්‍රකාරව නිල ඇඳුම් ලබාදීම හා නිල ඇඳුමින් සිටිය යුතු නිලධාරීන් නිල ඇඳුමින් නොසිටීම සම්බන්ධව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 16 ඡේදයේ විධිවිධාන යටතේ "අ" උපලේඛනගත වරදක් ලෙස සලකා ක්‍රියාකර කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත.

02. වත්තේගම නගර සභාවේ නිල ඇඳුමින රාජකාරියේ යෙදී සිටිය යුතු කාර්ය මණ්ඩලය නිල ඇඳුම් පැළඳ නොසිටීම මා වෙත නිරීක්ෂණය වූ බැවින් 2025.07.02 දිනැතිව ලිඛිතව ඔවුන් වෙත නිල ඇඳුම් පැළඳ සිටීම අනිවාර්ය බවට හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 27/91 යටතේ කටයුතු කරන ලෙසට ලිඛිතව දැන්වීමක්ද මා විසින් නිකුත් කර ඇත.

03. මේ පිළිබඳ තවදුරටත් විමර්ශනය කිරීමේදී නිල ඇඳුම් සඳහා දීමනා ලබා ගන්නද නිකුත් කරනු ලබන රෙදිපිලි ලබා ගන්නද ඒවා වෙනත් කාර්යයන් සඳහා යොදවා ගෙන ඇති බවට තහවුරු විය.

04. එබැවින් කනිෂ්ඨ කාර්යය මණ්ඩලයේ සියළුම දෙනා සඳහා ආයතන සංග්‍රහයේ XXI පරිච්ඡේදයේ 1:1 වගන්තිය ආවරණය වන පරිදි මෙම සියළුම ශ්‍රේණි සඳහා පොදුවේ පත් කරනු ලබන කමිටුවක එකඟතාවය මත සකස් කරනු ලබන නිර්මාණයකට අනුව ගුණාත්මක තත්ත්වයෙන් යුතු ඒ පර්ට නිකුත් කිරීම සුදුසු බවට යෝජනා කර ඉදිරිපත් කරමි.

වී.බී.වස්ගේවත්ත,

ලේකම්,

වත්තේගම නගර සභාව

වී.බී.වස්ගේවත්ත
ලේකම්
නගර සභාව
වත්තේගම

03.

# පාතදුම්බර තරුණ බෞද්ධ සමිතිය

ගොඩනැගිලි අරමුදල පුණ්‍යායතනයක් ලෙසට රජයේ ප්‍රකාශිතයි
(1993 අගෝස්තු 20 දින අංක 781 රජයේ ගැසට් පත්‍රය)

සමාගම් පනත යටතේ ලි.ප. අංකය : 282
බුද්ධශාසන අමාත්‍යාංශ ලි.ප. අංකය : 1764

අංක 73, නුවර පාර, වත්තේගම
දුරකථන : 081 2470182

2026 - 01 - 11

ගරු සභාපතිතුමා,
නගර සභාව,
වත්තේගම.

වරිපනම් ගාස්තු පිළිබඳව - පාතදුම්බර තරුණ බෞද්ධ සමිතිය

ගරු සභාපතිතුමනි !

2025 වසර දක්වා අප තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ල පුණ්‍යායතනයක් ලෙස සලකා (අංක 781 දරණ ගැසට් පත්‍රය මගින් පුණ්‍යායතනයක් ලෙස ලියාපදිංචි කර ඇත) වාර්ෂික බදු වලින් නිදහස් කර තිබුණි. නමුත් මෙය වාණිජමය ගොඩනැගිල්ලක් සේ සලකා වරිපනම් බදු ගෙවන ලෙස දන්වා ඇත. මෙම ආයතනය තුළ පවත්වාගෙන යන ඇගලුම් ආයතනය වෙනුවෙන් වෙනමම බදු ගෙවනු ලබයි. තවද අප ආයතනය විසින් සිදු කරනු ලබන ආගමික හා සමාජ සත්කාර සේවාවන් සඳහා මූල්‍යමය ප්‍රතිපාදන ලබා ගනු ලබන්නේ මෙම ඇගලුම් ආයතනයෙන් ගෙවනු ලබන කුලී මුදලින් බවද කාරුණිකව සිහිපත් කර සිටින්නෙමි.

එබැවින් මෙම කරුණු ගැන තවදුරටත් සලකා බලා මෙම ආයතනය පුණ්‍යායතනයක් ලෙස වරිපනම් ගාස්තුවෙන් නිදහස් කර දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

තෙරුවන් සරණයි.

ස්තූතියි

මෙයට විශ්වාසී

.................................

ගරු සභාපති
පාතදුම්බර තරුණ බෞද්ධ සමිතිය

ගරු සභාපති
පාතදුම්බර තරුණ බෞද්ධ සමිතිය
අංක 73, නුවර පාර,
වත්තේගම.

20 26 . 01 . 13 දින මහා සභාවට
ඉදිරිපත් කරන ලදී.
(අනුමත කළා / ප්‍රතික්ෂේප කළා) / ඉදිරියට කල් තැබුවා.
සිරස් අංකය : (ඔ) 03
යෝජනා : [illegible]
ස්ථිර : [illegible]
දිනය : 20 26 / 01 / 21
සභාපති / ලේකම්
වත්තේගම නගර සභාව

ගරු සභාපති
එස්.ඩබ්. බණ්ඩාරනායක
071-8188149 / 081-2476672

ගරු ලේකම්
ඩී.එම්.ඩබ්.එන්. විජේනායක
0714-899399 / 0812-470682

ගරු භාණ්ඩාගාරික
එල්.සී. ජයරත්න
0773-267929 / 0812-476738

04.

# පාතදුම්බර තරුණ බෞද්ධ සමිතිය

ගොඩනැගිලි අරමුදල පුණ්‍යායතනයක් ලෙසට රජයේ ප්‍රකාශිතයි
(1993 අගෝස්තු 20 දින අංක 781 රජයේ ගැසට් පත්‍රය)

සමාගම් පනත යටතේ ලිප අංකය : 282
බුද්ධශාසන අමාත්‍යාංශ ලිප අංකය : 1764
අංක 73, නුවර පාර, වත්තේගම
දුරකථන : 081 2470182

2026 - 01 - 11

ගරු සභාපතිතුමා,

නගර සභාව,

වත්තේගම.

පාතදුම්බර තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ල තුළ වරිපනම් අංකය යටතේ පවත්වාගෙන ගිය පෙර පාසල වසා දැමීම පිළිබඳව.

ගරු සභාපතිතුමනි !

වත්තේගම, පහළ යටවර, "ඇල්ගිරිය" ලිපිනයේ පදිංචි වයි. ප්‍රියන්ති චන්ද්‍රිකා මහත්මිය විසින් පාතදුම්බර තරුණ බෞද්ධ සමිති ශාලා ගොඩනැගිල්ලේ පවත්වාගෙන ගිය ලිට්ල් ප්ලවර්ස් පෙර පාසල 2026 වසරේ සිට පවත්වාගෙන යාමට නොහැකි බැවින් පෙර පාසල වසා දැමීමට තීරණය කළ බව අප වෙත දන්වා ඇත.

ඒ අනුව ඒ සඳහා නිකුත් කළ වරිපනම් ගාස්තු දැන්වීම අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවමි.

තෙරුවන් සරණයි.

ස්තූතියි
මෙයට
විශ්වාසී

.................................
ගරු සභාපති
පාතදුම්බර තරුණ බෞද්ධ සමිතිය.

එස්. ඩබ්. බණ්ඩාරනායක
ගරු සභාපති
පාතදුම්බර තරුණ බෞද්ධ සමිතිය
අංක 73, නුවර පාර,
වත්තේගම.

20.26..01..13. දින මහා සභාවට
ඉදිරිපත් කරන ලදී.
~~සම්මත කළා / ප්‍රතික්ෂේප කළා~~ / ඉදිරියට කල් තැබුවා.
සිරස් අංකය : (ආ) 04
යෝජනා :
ස්ථිර :
දිනය : 2026/01/21
සභාපති/ලේකම්
වත්තේගම නගර සභාව

| ගරු සභාපති | ගරු ලේකම් | ගරු භාණ්ඩාගාරික |
|---|---|---|
| එස්.ඩබ්. බණ්ඩාරනායක | ඩී.එම්.ඩබ්.එන්. විජේනායක | එල්.සී. ජයරත්න |
| 071-8188149 / 081-2476672 | 0714-899399 / 0812-470682 | 0773-267929 / 0812-476738 |

01.04.1 <u>ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි මෙම සමිතිය රජයේ ගැසට්පත්‍රයක් මඟින් නම් කරලා තියෙන පුණ්‍යායතනයක්. මොකද මම සමිතියේ ලේකම් වශයෙන් කටයුතු කරනවා, ඒ වගේම උප සභාපතිතුමත් මේ සමිතියේ ඉන්නවා. ඉතින් මේ පෙර පාසලේ ප්‍රධාන ආචාර්යතුමිය දරුවා විදේශ ගත වීම හේතුවෙන් මෙම පෙර පාසල පවත්වාගෙන යාමේ හැකියාවක් නොමැති බැවින් වසා දමා තියෙනවා. ඇඟළුම් කර්මාන්ත ශාලාව පමණක් පවත්වාගෙන යනවා. ඉතින් මේ ආයතනය පාතදුම්බර ප්‍ර දේශයේ සමාජ සත්කාර රාශියක් කරන ආයතනයක්, මේ සඳහා සම්පූර්ණයෙන් ගන්නේ මෙම පෙර පාසලේ හා ඇඟළුම් කර්මාන්ත ශාලාවේ ආදායමෙන්. ඉතින් මෙම ආයතනය පුන්‍යායතනයක් වන බැවින් මීට පෙර අපි සාකච්ඡා කරලා වරිපනම් වලින් නිදහස් කර ගත්තා. ඒ අනුව ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය මේ පිළිබඳව සලකා බලලා අවශ්‍ය කටයුත්තක් කරනවානම් හොඳයි කියලා මම යෝජනා කරනවා.

01.04.2 **<u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>**

හොඳයි අපි මේ පිළිබඳව මුදල් කාරක සභාවට කරුනු ඉදිරිපත් කරමු. මේ පිළිබඳව දැනගැනීම සඳහා පමනක් ඉදිරිපත් කරේ.

05.

2025.12.30

ලේකම්තුමා මගින්,
ගරු සභාපතිතුමා,
වත්තේගම නගර සභාව,
වත්තේගම

~~වත්තේගම නගර සභාවේ පවත්වාගෙන යනු ලැබූ පෞද්ගලික ඉන්වෙන්ට්‍රි ලේඛන හා පැරණි~~ ඉන්වෙන්ට්‍රි ලේඛන ඉවත්කර අලුතින් සෑම උප අංශයක් සඳහාම ප්‍රධානඉන්වෙන්ට්‍රි සකස් කිරීම සම්බන්ධ වාර්තාව.

2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණය සඳහා ඉදිරිපත් කිරීමට නව ඉන්වෙන්ට්‍රි ලේඛන සකස් කරන ලදී.

01. ඒ සඳහා මූලිකව 2025.05.26 දිනැති ලිපිය අනුව ලේකම් තුමාගෙන් ලබාගත් අනුමැතිය පරිදි ක්‍රියා කර, පෞද්ගලික ඉන්වෙන්ට්‍රි ලේඛන 01,02,03 හා ප්‍රධාන ඉන්වෙන්ට්‍රිය නමින් පවත්වාගෙන යනු ලැබූ ඉන්වෙන්ට්‍රිය ද ඇතුලත් ව සියලුම ලේඛන පරීක්ෂාවට ලක් කරන ලදී. ඒ අනුව 2019 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණ වාර්තා,වෙන්දේසි හා අපහරණ වාර්තා සියල්ල ද සැලකිල්ලට ගෙන මේ වන විට පැවති පුද්ගලික ඉන්වෙන්ට්‍රි ලේඛන සියල්ල ද පරීක්ෂාවට ලක් කර මෙම නව ඉන්වෙන්ට්‍රි ලේඛන සකස් කරන ලදී.

02. 2024.12.31 දිනට පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයට ඉදිරිපත් නොකළ ඌන භාණ්ඩ සම්බන්ධයෙන් විශේෂයෙන් පරීක්ෂා කළ අතර පෞද්ගලික ඉන්වෙන්ට්‍රි ලේඛනවල තිබූ අඩුපාඩු හේතුවෙන් එම තත්වය උද්ගතවී ඇති බව සොයාගත් අතර එම ඌනතා දිගින් දිගටම භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වලින් පෙන්වා දී තිබීම ද හඳුනාගන්නා ලදී.

03. එක් අයෙකුගෙන් ඉවත් කර වෙනත් අයෙකුට පවරා දීම් සිදුකිරීමේදී විධිමත්ව ලේඛන ගත නොවීම හා 2012 වසරට පෙර භාණ්ඩ භාරදීම් හා නිකුත් කිරීම් නියෝග ලබා නොදී ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සඳහන් නමකට භාණ්ඩ ඇතුළත් කර තිබීම හේතුවෙන් එක් එක් සේවක මහතුන්ගේ නම් ඉදිරියේ ඔවුන් භාරයේ නොපවතින භාණ්ඩ රැසක් ලේඛන ගත කර ඇති බව ද හඳුනාගන්නා ලදී.

04. මේ වන විට ආයතනයේ පවත්වාගෙන ගොස් ඇති පෞද්ගලික ඉන්වෙන්ට්‍රි ලේඛන 01,02,03 හා ප්‍රධාන ඉන්වෙන්ට්‍රිය නමින් පවත්වාගෙන ගොස් තිබූ එක් ලේඛනයක්ද වූ අතර පැරණි පෞද්ගලික ඉන්වෙන්ට්‍රි ලේඛනවල ඇතුළත් කර තිබූ පහත අඩුපාඩු සොයා ගන්නා ලදී. එකී අඩුපාඩු නිරවුල් කිරීමේදී පෙර වසරේ ඌන භාණ්ඩ නොමැති බව ද හඳුනාගෙන ඇත. ඉන්වෙන්ට්‍රිවල සටහන් කිරීමේ දෝෂ හේතුවෙන් එම තත්වය උද්ගතව ඇති බව පැහැදිලි වී ඇත. ඒ අනුව හඳුනාගත් කරුණු අතර,

- මේ වන විට ස්ථාන මාරු වී‍ගොස් ඇති සහ විශ්‍රාම ගොස් ඇති නිලධාරින්ගේ සහ සේවකයින්ගේ නම් නිවැරදිව සටහන් යොදා ලේඛන යාවත්කාලීන කර නොතිබීම
- වැරදි සටහන් හා ද්වි ගණන සටහන් තිබීම.
- ඉවත් කරන ලද භාණ්ඩ සටහන් කිරීමට තීරුවක් නොමැතිව ඉතා පැරණි ඉන්වෙන්ට්‍රි ලේඛනයක් ද පවත්වාගෙන යන බැවින් එම ලේඛනයෙන් භාණ්ඩවල ශේෂ නිවැරදිව ලබාගැනීමට අපහසුතා ඇති වීම.
- වර්ෂය අවසානයේ පැවති ශේෂයන් ඉදිරියට ගෙන ඒමේදී සිදුකර ඇති හා ලේඛනගත කිරීමේදී සිදුවී ඇති වැරදි හා අඩුපාඩු.
- වෙනත් පිටුවකට ගෙන යෑමේදී සිදුකර ඇති වැරදි සටහන්
- වෙනත් අංශයකට භාණ්ඩ හුවමාරු කර ඇති අවස්ථාවල ඉන්වෙන්ට්‍රි ලේඛන වල අදාල පිටුවලින් ඉවත් නොකර භාණ්ඩ භාරදී ඇති ස්ථානයේ පමණක් සටහන් යොදා තිබීම

- වෙන්දේසි භාණ්ඩ හා අපහරණ භාණ්ඩ විධිමත් පරිදි ලේඛන වලින් ඉවත්කිරීම් සිදු නොකිරීමේ අවස්ථාවන්
- 2013 වසරට පෙර වෙන්දේසි කරන ලද භාණ්ඩ විධිමත් පරිදි ලේඛන වලින් ඉවත් නොකර පැවති ශේෂයන් ඉදිරියට ගෙන ගොස් තිබීම
- 2024 වර්ෂයට පෙර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව එක් එක් වාර්තාවල සිදු අඩුපාඩු නිවැරදි කර නොතිබීම.
- ප්‍රධාන ඉන්වෙන්ට්‍රිය නමින් පවත්වාගෙන ගොස් ඇති ලේඛනයේ 2018 වර්ෂයෙන් පසු 2024 වර්ෂය වන තෙක් වර්ෂ අවසානයේ ශේෂ සටහන් කර නොතිබීම හා එම ලේඛනය භාණ්ඩ සමීක්ෂණයට ඉදිරිපත් කර නොතිබීම.

05. වත්තේගම නගර සභාව සතුව පැවති පෞද්ගලික ඉන්වෙන්ට්‍රි ලේඛන අනුව පෙර පැවති භාණ්ඩ සමීක්ෂණය සිදුකර ඇති අතර ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛන අනුව භාණ්ඩ සමීක්ෂණ සිදුකරන ලෙස දන්වා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල විසින් නිර්දේශ ලබා දී ඇතත්, වසර ගණනාවක්ම ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබීම හේතුවෙන් ප්‍රධාන ඉන්වෙන්ට්‍රි විධිමත් පරිදි සකස් කිරීමට ද අවධානය යොමු කර නොතිබිණි.

06. ඒ අනුව 2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ සඳහා ඉදිරිපත් කිරීමට පහත සඳහන් පරිදි ප්‍රධාන ඉන්වෙන්ට්‍රි සකස් කර අවසන් කර ඇත.

- කාර්යාලයීය ප්‍රධාන ඉන්වෙන්ට්‍රිය
- මහජන පුස්තකාල ඉන්වෙන්ට්‍රිය
- ළමා පුස්තකාල ඉන්වෙන්ට්‍රිය
- ආදාහනාගාර ඉන්වෙන්ට්‍රිය
- උඩුරාවණ ක්‍රීඩාංගණයේ ඉන්වෙන්ට්‍රිය
- රාස්ඇල්ල ජල ව්‍යාපෘතිය ඉන්වෙන්ට්‍රිය

07. පෞද්ගලික ඉන්වෙන්ට්‍රි ලේඛනයේ එක් එක් නිලධාරීන් විසින් භාරකාරීත්වය දරණ භාණ්ඩලව වගකීම සඳහන් කර ඇති අතර ප්‍රධාන ඉන්වෙන්ට්‍රිය සකස් කිරීමේදී එම භාණ්ඩවල මුළු එකතුව අනුව ලේඛන ගත කර ඇත. නිලධාරියෙකු ස්ථාන මාරු වීමේදී හෝ විශ්‍රාම යෑමේදී කාර්යාලයෙන් ඉවත් වන විට නවක නිලධාරීන් වෙත එම වගකීම නැවත පවරා ඉන්වෙන්ට්‍රි ලේඛන යාවත්කාලීන වියයුතු බවට පෙන්වා දෙමු.

08. එම අඩුපාඩු සියල්ල නිවැරදි කර ඌනතා භාණ්ඩ හඳුනාගෙන නව ඉන්වෙන්ට්‍රියට ඇතුළත් කර ඇති බවත්, අවසන් වරට සිදුකරන ලද 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ පොදු නිරීක්ෂණ ද සැලකිල්ලට ගෙන නව ඉන්වෙන්ට්‍රි ලේඛන සකස් කර ඇති බවත් 2025.12.31 දිනට සිදුකරන භාණ්ඩ සමීක්ෂණය සඳහා එම ලේඛන අනුව භ.භා.ග.ප.66 සකස් කර ඉදිරිපත් කරන බවත් කාරුණිකව දන්වා සිටිමු.

01.එස්.ඩී.එස්.විජේරත්න මහතා -ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි -

02.ඒ.එච්.එම්.ජී.ඩබ්.අයි.කේ.යටවර මිය -කළමණාකරණ සේවා නිලධාරි -
(2025 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ හා ඉන්වෙන්ට්‍රි ලේඛන භාර නිලධාරි)

03.පී.ඒම්.සී.දිල්රුක්ෂි මිය - සංවර්ධන නිලධාරි -
(2022 වර්ෂයෙන් පසු භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ හිටපු සාමාජික)

04.ජී.ජී.ආර්.කුමුදුනි ගලපිටගෙදර මිය -සංවර්ධන නිලධාරි -
(2023 වසරෙන් පසු භාණ්ඩ සමීක්ෂණ විෂය භාර)

05රාධිකා ගලපිටවත්ත මිය - සංවර්ධන නිලධාරි -
(2023 වසරෙන් පසු ඉන්වෙන්ට්‍රි භාගබඩා භාර නිලධාරි)

01.05.1 ගරු නගර සභා උප සභාපති ජේ.ඒ.යූ ගමගේ මැතිතුමා
ගරු සභාපතිතුමනි මම දකින පළමුවෙනි වැරැද්ද තමා යම් භාණ්ඩයක් ලැබුණ වේලාවේ තමා ගිණුම් ගත කරලා තියෙන්නේ. ඉතින් අපි බලමු ඉදිරියේදී මෙම වැරදි නිවැරදි කරගන්න. ඒ වගේම යම් ඉන්වෙන්ට්‍රි භාණ්ඩයක අංකයක් දුන්නාම ඒ අංකයම තමා දිගින් දිගටම පවත්වාගෙන යන්නේ. නමුත් මෙම ඉන්වෙන්ට්‍රි ලේඛණය බලද්දි භාණ්ඩ හොයාගන්නත් බෑ, ඉන්වෙන්ට්‍රි හොයා ගන්නත් බෑ.ඉතින් දැන්වත් අපි මේක නිවැරදි කරගන්න බලමු. අපි උත්සහ කරා, ඒ උත්සහය සාර්තකයි.

02. කාරක සභා වාර්තා සලකා බැලීම

I. 2025.12.30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ වාර්තාව.

**02.1.1** <u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් අබේකෝන් මැතිනිය</u>
ගරු සභාපතිතුමනි මම මේ කියන්නේ ඔබතුමා නැතිනාස්ති කරන්නේ නැතුව මෙම සබාව පවත්වාගෙන යන්නේ, ඉතින් ඔබතුමා දැනුවතද දන්නේ නෑ. මම මේ දැකපු දෙයක් කියන්නේ. 2025.12.29 දින උදේ 8.40 පමණ අපේ කාර්යාලයේ LE – 7492 කැබ් රථය වත්තේගම පක්ෂ කාර්යාලය ලඟ නතර කරලා රියදුරු අජිත් මහතා වාහනය උඩ නැගලා පක්ෂ කාර්යාලයෙන් පෝස්ටර්ස් වගයක් පටවනවා කැබ් රථයට. ඉතින් මම ඉල්ලා සිටිවා මේ පිළිබඳව පොඩ්ඩක් හොයලා බලන්න කියලා.

02.1.2 <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>
මන්ත්‍රීතුමිය ඒ ගුරු සංගමයේන අපිට ලැබුණා පොත් වගයක් පාසල් දරුවන් සඳහා බෙදා දෙන්න කියලා.

02.1.3 <u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.එම්.එම් අබේකෝන් මැතිනිය</u>

ගරු සභාපතිතුමනි ඒ මොහොතේ පක්ෂ මන්ත්‍රීවරුන් කවුරු හෝ හිටියනම් ගැටළුවක් නෑ. මම දැක්කේ නෑ කවුරුත් එතන ඉන්නවා.

02.1.4 <u>ගරු ඊ.ජී.ජේ. ආරියවංශ මහතා</u>
ඒ සම්බන්ධව සියළුම වගකීම අරගෙන කටයුත් කලේ මම. අපිට පාසල් දරුවන් සඳහා බෙදා දීමට පොත් වගයක් එවලා තිබ්බා. ඒ සඳහා ගුරු සංගමයෙන් ඉල්ලීමක් කරලා තිබ්බා වාහානයක් ලබා දෙන්න කියලා. ඒ අනුව යටිරාවන පාසලට පොත් කට්ටල 25, පාතදුම්බර පොත් කට්ටල 30, වත්තේගම මධ්‍ය මහා විද්‍යාලය පොත් කට්ටල 48, පන්විල රාජසිංහ විද්‍යාලයට පොත් කට්ටල 17, පන්විල කණිෂ්ඨ විද්‍යාලයට පොත් කට්ටල 05 ඉතින් ඇත්තටව මෙම පොත් කට්ටල බෙදා දීමෙන් අනතුරුව ඉතිරි වූ පොත් තමා එතන බෑවා. ඒ අවස්ථාව තමා මම හතන්නේ මෙතුමිය දැකලා තියෙන්නේ.

03 මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසරය - නැත

04 පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.

04.1 <u>ගරු උප සභාපති ජේ.ඒ යූ ගමගේ මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි මට හම්බුණා 2026 අයවැය ලේඛණය.මේවා සුරංගනා කථා වගේ. මොකද මේ සඳහන් කරලා තියෙන පාය ක්‍රියාවට නගන්නේ නැතුව පෙළ ගැහෙන්නේ නැත්තම්, තියාගෙන ඉඳලා වැඩක් නෑ. ඒ අනුව මම ඔබ තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා වැරදි අඩු කරගෙන, අපි සැලසුම් කරලා තියෙන වැඩ කටයුතු ඉෂ්ඨ සිද්ධ කරගන්න ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

04.2 <u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ජී.ආර්. ගුණවර්ධන මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි මාර්ගය ශුද්ධ කිරීම හා පවිත්‍ර කිරීම, මේ සඳහා බලහෙල මාර්ගයේ වැලිකල මහතාගේ නිවස අසලින් පවිත්‍ර කිරීම. මේ සඳහා වෙන් කරලා තියෙන්නේ පෙ.ව 10.30. නමුත් මෙයාලා වැඩට එන්කොටම පෙ.ව 11.00 වෙනවා.ඒ වගේම ඔවුන් තමන්ගේ කටයුතු ඉටු කරන්න අවශ්‍ය කිසිම උපකරණයක් අරගෙන යන්නේ නෑ. හැම තැනම අවිදලා ගෙවල් වලින් ඒවා අපි හොයලා දෙන්න ඕන. ඒ වගේම ලඟ හිටියොත් වැඬේ කරනවා නැත්තන් බාගෙට වැඩ කරලා ප.ව 2.30ට වැඩ අවසන් කරන්න මෙහෙන් ප.ව 1.45ට පමණ යනවා. ඉතින් හරියට වැඩක් කරගන්න වෙන්නේ නෑ.ඉතින් මේ ගැන අවධානය යොමු කරන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා.

04.3 <u>ගරු නගර සභා මන්ත්‍රී ඩී.ඩබ්.ආර්.ඩබ්.එම්.එම්.ඩබ්.ජී. එන්.විජේනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි රංජිත් මන්ත්‍රීතුමා කියපු කථාවට මම එකඟ වෙනවා. ඒ නිසා තමා අපි ආපු මුල් කාලමෙ කිව්වේ සේවකයන් මදිනම් ප්‍රමාණවක් සේවකයන් පිරිසක් බඳවා ගැනීමක් කරමු කියලා. චෙක් රෝල මඟින් දෛනික වැටුප් ගෙවීම සඳහා පිරිසක් බඳවා ගමු.

**04.3.1** ඒ වගේම දිනකට එක පාරක් තෝරාගෙන ඒ පාර පිරිසිදු කිරීම සඳහා දිනකට මෙච්චර කිලෝමීටර් ප්‍රමාණයක් පිරිසිදු කළ යුතුයි ලෙස නම් කිරීමෙන් අඩුම මාස කට සැරයක්වත් එක පාරක් සිරිසිදු කිරීම කළ හැකියි. නමුත් ඒ කාර්ය ඉටු කිරීමට මේ ඉන්න සේවක පිරිසනම් හොදටම ප්‍රමාණවත් මදි. ඒ අනුව ඒ ගැන අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

**04.3.2** ඒ වගේම නගරය පිරිසිදු කිරීමට වෙනම පිරිසක් යොදවා ගැනීමටත්, ඔවුන්ගේ රාජකාරි පෙ.ව 10.30ට අවසන් වූ පසු වෙනත් හදිසි රාජකාරි සඳහා යොදවා ගැනීමටත්, අනෙකුත් මං මාවත් වල කටයුතු කිරීමට වෙනම පිරිසකුත් ලෙස දෙපිරිසත් සිටීම මඟින් මෙම ගැටළුව නිරාකරණය කර ගත හැකි වෙයි. ඉතින් මේ සඳහා ආවම සේවකයින් 06 දෙනෙත්වක් මේ කාරනය සඳහා බඳවා ගත යුතුයි. අපි සියළුම මන්ත්‍රීවරු මේ සඳහා ඔබතුමාට ඒකමතිකව බලය පවරලා තියෙනවා ඉතින් මම ඉල්ලා සිටිනවා නගරයේ මහජනතාව වෙනුවෙන් මෙම කාර්ය කඩිනමින් ඉටුකරලා දෙන්න කියලා.

**04.3.3** ගරු සභාපතිතුමනි අයවැය වලදි වෙන් කරලා සඳහන් කරලා තියෙනවා සංවර්ධන යෝජනා කීපයක්, ඉතින් සභාපතිතුමනි මං 2025.08.12 මහා සභා වාර්තාවේ මම ඉදිරිපත් කරපු යෝජනවා නල සඳහන් වෙලා සඳහන් වෙලා තියෙනවා 2026 සංවර්ධන යෝජනා සඳහා ඉදිරිපත් වෙලා තියෙනව බව. නමුත් මෙහි මගේ යෝජනා කිසිවත් නෑ.

**04.3.4** <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>

ඔව් මන්ත්‍රිතුමා මම සඳහන් කරලා තියෙනවා. නමුත් මේ සඳහන් වෙලා තියෙන්නේ අපේ සභා අරමුදල් වලින් වෙන් වූ යෝජනා පමණයි. අපිට පළාත් පාලනෙන් ලැයෙන අරමුදල් වලින් තවත් සංවර්ධන කටයුතු කිරීමේ හැකියාව තියෙනවා. ඉතින් අපි ඒ දේවල් එම මුදල් වලින් සිදු කරමු. මේ තියෙන්නේ 2026 වර්ෂයේ සිදුකරන සියළුම ව්‍යාපෘති නොවෙයි.

04.3.5 ඒ වගේම ගරු සභාපතිතුමනි මම පෞද්ගලිකව මැදිහත් වෙලා නව රෝහල අසළ ස්ථිර වැසිකිලි පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙනවා, ඒ අනුව ඇස්තමේන්තුවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරා, නමුත් තාම ඒ සඳහා ඇස්තමේන්තුවක් ලබා දීලා නෑ. මම ඒක දීර්ගකාලීනව සලකලා බලලා තමා යෝජනා කලේ. මොකද ඒ වැසිකිලිය පසුකාලීනව අපිට ළමා උද්‍යානයට භාවිතා කරන්න පුළුවන්.

**04.3.6** <u>ගරු සභාපති ඩී.එස් උයන්ගොඩ මැතිතුමා</u>
දැනටමත් ස්ථිර ලෙසම තමා මේ කටයුතු කරන්නේ. අපි වල භාරලා තියෙන්නේ, ඒ අනුව වලලු බස්සන්න තියෙන්නේ.

04.4 <u>ගරු නගර සභා මනිත්‍රි ඒ.එම්.එම් අබේකෝන් මැතිනිය</u>
ගරු සභාලතිතුමනි මම ඔබතුමාගේන ඉල්ලා සිටිනවා විදුලිබල මණ්ඩලට තීන්දුවක් ලෙස ලිපියක් යවන්න කියලා අටලහගොඩට යන පාරේ තාම විදුලි කණු ඇල වෙලා තියෙනවා. අනෙත් එක අඹගස්තැන්න පාරේ විදුලි රැහැන් ගැගවිලා පාරදිගේ තියෙන්නේ. මිනිස්සු උඩින් පැන පැන යන්නේ. ඉතින් මම ඉල්ලා සිටිනවා මේ පිළිබඳව විදුලිබල මණ්ඩලය දැනුවත් කරන්න කියලා.

04.4.2 ඒ වගේම අටලහගොඩ ප්‍රධාන මාර්ගයේ බෝඅංග මහතාගේ නිවස අසල සිට නිමල් අබේකෝන් මහතාගේ නිවස කාණුව බැකෝ එකෙන් පස් ඉවත් කරේ නැත්තන් පල්ලෙහා චන්ද්‍රකාන්ති මහත්මියගේ ගෙදරට ලොකු අවදානමක් තියෙනවා.පවිත්‍ර කරලානෑ.

04.5 <u>ගරු නගර සභා මන්ත්‍රි ආර්.ජී.යූ.සෙතානී රාජමන්ත්‍රී</u>
අපි මේ නගර සභාවේ අඩුපාඩු හදාගෙන ගමනක් යමු. ඒ වගේම මම කියන්න කැමතී අපි දිගින් දිගටම යෝජනා ගෙනාවා ඒ උනාට තාම ක්‍රියාත්මක නොවුන යෝජනා ගොඩක් තියෙනවා.ඉතින් අපි ඒ යෝජනාත් පුළුවන් ඉක්මනින් ක්‍රියාවට නංවමු. ඒ වගේම අපේ ලේකම්තුමා කිව්වා වතුර බට සියල්ලම තියෙන්නේ පාර දිගේ කියලා. ඉතින් ඉක්මනටම කැඩෙනවා. අපි මාසයක් අරගෙන නැවත බට පොළව යටින් එලීමක් කරමු කිව්වට තාම ඒ වැඩේ

උනෙත් නෑ. ඒ වගේම ළමා පුස්ථකාලයේ කටයුත්ත තාම තරගන්න බැරි උණා. මේ වසරේවත් ඒ දේ කඩිනමින් කරගමු කියලා මම යෝජනා කරනවා. ඒ වගේම අතුරු මාර්ග වල යන්න බෑ විදුලි බුබුළු නෑ අඳුරේ තියෙන්නේ. ඒ වගේම මාස හයටම එක විදුලි බුබුලක් දාලා දීලා තියෙනවා. ඉතින් 2026 වසරට සියව දෙනාට සුභ ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

04.6 <u>ගරු නගර සභා මන්ත්‍රී සී.ඩී ගුරුගල්ගේ මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි අපි 2026 වර්ෂය සඳහා වරිපනම් හා ජල ගාස්තු වැඩි කිරීමක් සිදු කරලා තියෙනවා. ඉතින් අපි මේ පිළිබඳව නගරයේ ප්‍රජාව දැනුවත් කිරීමක් ලෙස අත් පත්‍රිකාවක් ලබා දීම සුදුසු බවට යෝජනා කරනවා.

04.6.2 ඒ වගේම න්‍යාය පත්‍රය කලින් ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටින අතර, එම ත්‍රි රෝද රථයේ විදුලි බල්බය ක්‍රියාත්මක නෑ ඒ පිළිබඳව සොයා බලන ලෙස මා ඉල්ලා සිටිනවා.

04.6.3 ඒ වගේම නාරංදණ්ඩ පාරේ කුණු එකතු කිරීම සඳහා අත් කරත්තයක් යවනවානම් හොඳයි කියලා මම ඉල්ලා සිටිනවා.

04.6.4 ඒ වගේම අපේ සේවක මණ්ඩලය තෘප්තිමත් භාවයකින් වැඩ කරන්නේ නෑ. කුමක් හෝ ප්‍රශ්ණයක් තියෙනවා එයාලට. ඒ නිසා ජල අංශයේ හා කර්මාන්ත අංශයේ අය නිතර නිතර නිවාඩු ගන්නවා. ඒ අනුව නිසියාකාරව රාජකාරි ඉටු කිරීමේ හැකියාවක් නෑ. කාර්යාපය තුළ සිටින සේවක මණ්ඩලයත් නියමිත වැඩ කරනවා නමුත් කිසිම තෘප්තියකින් ඒවා ඉටු කරන බවක් පේන්න නෑ. ඒ අනුව මේ පිළිබඳව හේතු හොයලා සුදුසු වැඩ පිළිවෙලක් යොදන මෙන් ඉල්ලා සිටිනවා.

05 ගරු සභාපතිතුමාගේ පැහැදිලි කිරීම්.

05.1 (ක) යටතේ දෙසැම්බර් මසට අදාල ආදායම් වියදම් වාර්ථාව ඉදිරිපත් කරන බවට න්‍යායපත්‍ර යේ සඳහන් වුවත් මේ සඳහ ඇතුලත් කිරීමේ හැකියාවක් තිබුනේනෑ යම් යම් අඩු පාඩු ඇති නිසා.

05.2 ඒ අනුව රංජිත් මැතිතුමා පැවසූ පරිදි අපි උපකරන ඇතුව සේවකයන් නිසි වේලාවට රාජකාරියට යොදවන්න බලාපොරොත්තු වෙනවා.

05.3 විජේනායක මැතිතුමා පැවසූ පරිදි දෛනික පදනම මත සේවකයන් ලබා ගැනීමට අපි ඉල්ලීමක් කරලා බලමු.

05.4 මොනිකා මැතිතුමිය පැවසූ පරිදි විදුලිබල මණ්ඩලයට දැනුම්දීමක් කරලා බලමු.

05.5 රාජමන්ත්‍රී මැතිතුමා පැවසූ පරිදි වීදී සඳහා විදුලි බුබුළු යොදන්න කටයුතු කරමු.

05.6 ඒ වගේම අපි වියදම් කරන යෝජනාම ගේන්නේ නැතුව, ආදායම් උත්පාදන යෝජනත් මේ ගරු සභාව වෙත යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

05.7 ඒ වගේම ගුරුග්ලේ මැතිතුමා පැවසුවා සේවක තෘප්තිය පිළිබඳව, තමන් කරන වැඩේ අඩුපාඩු නැතුව නිවැරදිව කරානම් තමනුත් තෘප්තිමත්- ආයතනයත් තෘප්තිමත්. ඒ අනුව තෘප්තිමත් වෙන්නනම් තෘප්තිමත් සේවාවත් දෙන්න ඕන ඒ වගේම අපි ජනවාරි පළමුවැනිදා අපි සේවක ඇහයීමක් කළා.ඒ වගේ සියළුම දෙනාගේ ඇඩියාවල් වලට සවන් දෙන්න විදියක් නෑ, අපි දෙගොල්ලොම රාජකාරියක් කරන්නේ ඒ නිසා රාජකාරිය සඳහා වාර්ථා නොකරනවා නම් මං

වැටුප් රහිත නිවාඩු ලබා දෙන්නේ. ඒ වගේම යම් කොනෙක් ලබපැම් කරනවානම් ඒ පිළිබඳව වාර්ථා කරන්න. මේ පිළිබඳව මං පැමිණිලි පෙට්ටියක් දාන්නම් ඒ සඳහා නාමිකව හෝ නිර්නාමිකව පැමිණිලි දාන්න.

(ක) මාසික අයවැය සටහන් හා කර්මාන්ත පිළිබඳ ප්‍රගති වාර්තා හා වෙනත් ලිපි

1. 2025නොවැම්බර් සහ දෙසැම්බර් මසට අදාල ආදායම් වියදම්.
2. 2025.12.31 දිනට ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය.

**සභාවේ නිමාව**

ගරු සභාපති ඩී.එස්.උයන්ගොඩ මැතිතුමා විසින් සභාවේ කටයුතු ප.ව 12.30 ට අවසන් කරන ලදි.

ඩී.එස්. උයන්ගොඩ
සභාපති
වත්තේගම නගර සභාව

....................................... දින පැවති මාසික මහා සභාවේ වාර්තාව සහා සම්මත කිරීම

සංශෝධන

.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
.......................................................................................................................................................
..................................................

2026 ...................... මස........................වන දින පැවති, 2026 ...................මස මාසික මහා සභාවේ රැස්වීම් වාර්තාව ගරු නගර සභා උප සභාපති/ ගරු නගර සභා මන්ත්‍රී ........................................................................... මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නගර සභා උප සභාපති/ ගරු නගර සභා මන්ත්‍රී ....................................................................... මැතිතුමාගේ ස්ථිරත්වයෙන් 2026 ................. මස ................. දින පැවති මහා සභාවේදී ඒකමතිකව සහා සම්මත කරන ලදි.

ඩී.එස්. උයන්ගොඩ
ගරු සභාපති
වත්තේගම නගර